මොරටුව විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

ප්‍රසම්පාදන දැන්වීමයි
ශිෂ්‍ය ආපනශාලා සඳහා සේවා සැපයීම

මොරටුව විශ්වවිද්‍යාලයේ පහත සඳහන් ආපනශාලාවන් **2026** වර්ෂයේ **දෙසැම්බර් මස 16 දින** සිට වසරක කාලයක් පවත්වාගෙන යාම සඳහා මුද්‍රා තබන ලද ලංසු පත් **2026.11.25** ප.ව. 2.30 දක්වා භාරගනු ලැබේ.

1. "එල්" ආපනශාලාව
2. කිරිහල

ඉහත සඳහන් ආපනශාලාව සඳහා වෙන් වෙන් වශයෙන් ආපසු ගෙවනු නොලබන රු. 500.00 ක ලංසු ගාස්තුවක් මෙම විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් රිසිට්පත විශ්වවිද්‍යාලයේ සුභසාධක අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අදාළ ලංසු පත්‍ර **2026.11.09** දින සිට **2026.11.23** දින දක්වා කාර්යාලීය දින වල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලබා ගත හැක.

මුද්‍රා තබන ලද ලංසු, පළමු පිටපත සහ දෙවන පිටපත ලෙස වෙන් වෙන්ව ලියුම් කවර දෙකක බහා, එම පිටපත් දෙකම එකම කවරයක බහා **2026.11.25** දින ප.ව. 2.30 ට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන පරිදි,

නියෝජ්‍ය/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,
සුභසාධක අංශය,
මොරටුව විශ්වවිද්‍යාලය,
කටුබැද්ද, මොරටුව.

යන ලිපිනයට එවීම හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ නව පරිපාලන ගොඩනැගිල්ලේ බිම්මහලෙහි පිහිටි සුභසාධක අංශයේ තබා ඇති ලංසු බහාලන පෙට්ටියට පෞද්ගලිකව පැමිණ බහාලීම කළ යුතුය. සියලුම ලංසු සමඟ විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවනු ලැබූ රු. 5,000.00ක ආපසු ගෙවනු ලබන ලංසු ආරක්ෂක තැන්පතුවක් ඉදිරිපත් කළ යුතුය **(ලදුපතෙහි මුල් පිටපත ලංසු පත්‍රය සමඟ අමුණා එවිය යුතුයි)**. ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු පත්‍ර බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල වන පරිදි **"එල්" ආපනශාලාව/කිරිහල** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණය අවසන් තීරණය බව සැලකිය යුතුය. විකල්ප ලංසු පත්‍ර භාරගනු නොලැබේ.

ලංසු පත්‍ර **2026.11.25** දින ප.ව. 2.30 දක්වා භාරගනු ලබන අතර ලංසු භාර ගැනීම අවසන් වූ විගස සුභසාධක අංශයේ රැස්වීම් ශාලාවේදී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

ලේඛකාධිකාරි,
මොරටුව විශ්වවිද්‍යාලය,
කටුබැද්ද, මොරටුව.